**ශීර්ෂය 272 - කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය**
**විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**
**-----------------------------------------------------------**

## 1.1 දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රධාන කාර්යයන්

(අ) රජයේ සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘති රජයේ නියමයන්ට අනුකූලව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සම්බන්ධීකරණය හා මඟ පෙන්වීම.

(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල කටයුතු සම්බන්ධීකරණය හා මඟ පෙන්වීම.

(ආ) ව්‍යවස්ථාපිත අණපනත්වලින් පැවරී ඇති බලතල හා වගකීම් ඉටු කිරීම.

(ඇ) වෙනත් රේඛීය අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තුවල දිස්ත්‍රික් නියෝජ්‍ය ආයතනය වශයෙන් කටයුතු කිරීම.

(ඈ) දිස්ත්‍රික්කය තුළ නීතිය හා සාමය පවත්වාගෙන යාමටත්, ජනතාවගේ ආරක්ෂාව තහවුරු කිරීමටත්, ආරක්ෂක අංශය සමඟ මනා සම්බන්ධතාවයක් පවත්වා ගැනීම.

(ඉ) රාජ්‍ය ආදායම ගණන්දීමේ නිලධාරීන් වෙනුවෙන් නියෝජිතයෙකු වශයෙන් රාජ්‍ය ආදායම එකතු කිරීමේ හා ගිණුම්ගත කිරීමේ මධ්‍යස්ථානයක් ලෙස කටයුතු කිරීම.

## 1.2 දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල

(අ) කුරුණෑගල
(ආ) පන්නල
(ඇ) වාරියපොල
(ඈ) ඉබ්බාගමුව
(ඉ) ගනේවත්ත
(ඊ) මහව
(උ) ගිරිබාව
(ඌ) අඹන්පොල
(එ) පඩුවස්නුවර (බටහිර)
(ඒ) පඩුවස්නුවර (නැගෙනහිර)
(ඔ) කුලියාපිටිය (බටහිර)
(ඕ) කුලියාපිටිය (නැගෙනහිර)
(ක) අලව්ව
(ග) මාවතගම
(ච) පොල්ගහවෙල
(ජ) රිදීගම
(ණ) මල්ලවපිටිය
(ත) මාස්පොත
(ද) බිංගිරිය
(ධ) නාරම්මල
(න) පොල්පිතිගම
(ප) ගල්ගමුව
(බ) ඇහැටුවැව
(භ) නිකවැරටිය
(ම) කොබෙයිගනේ
(ය) රස්නායකපුර
(ර) කොටවෙහෙර
(ළ) වීරඹුගෙදර
(ල) බමුණාකොටුව
(ව) උඩුබද්දාව

**1.3 විගණන විෂය පථය**

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ඔක්තෝබර් 22 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.4 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.5 විගණන නිරීක්ෂණය**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.6 සිට 1.18 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

2002 නොවැම්බර් 28 දිනැති අංක. IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පරිගණක, උපාංග හා මෘදුකාංග සම්බන්ධ ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

**(ආ) විගණන සාක්ෂි නොවීම**

ගිරිබාව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාලව, මුදල් රෙගුලාසි 272(2) ප්‍රකාරව කටයුතු නිම නොකළ රු.1,800 ක් වටිනා ගෙවීම් වවුචරයක් අස්ථානගත වී තිබුණි.

**(ඇ) විසර්ජන ගිණුම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(i). මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.1,398,406,025 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.1,398,236,067 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.169,958 ක් හෙවත් සියයට 0.01 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| **වියදම** | **2013 දෙසැම්බර් 31 දිනට** | | | **ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---|---|---|---|
| | **ශුද්ධ ප්‍රතිපාදනය** | **උපයෝජනය** | **ඉතිරිය** | |
| | රු. | රු. | රු. | |
| පුනරාවර්තන | 1,361,906,025 | 1,361,898,686 | 7,339 | 0.00 |
| මූලධන | 36,500,000 | 36,337,381 | 162,619 | 0.45 |
| **එකතුව** | **1,398,406,025** | **1,398,236,067** | **169,958** | **0.01** |

**(ii). වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා වෙනත් අමාත්‍යාංශ 28 ක් හා දෙපාර්තමේන්තු 19 ක් විසින් එකතුව රු.8,540,969,924 ක් වූ ප්‍රතිපාදන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු අතර, එම ප්‍රතිපාදන පිළිවෙලින් රු.3,853,111,538 ක් හා රු.3,654,468,391 ක් වශයෙන් එකතුව රු.7,507,579,929 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට පිළිවෙලින් රු.994,963,282 ක් හා රු.38,426,713 ක් වශයෙන් එකතුව රු.1,033,389,995 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. එම ඉතිරියන් සළසා තිබුණු ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 21 ක් හා සියයට 1 ක් වි තිබුණි.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂයය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 27201 | 95,000,000 | 54,413,604 | 69,000,000 | 74,328,658 | 375,000,000 | 261,515,647 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). විෂය අංක 27201 දරන අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.4,685,974 ක් වූ අතර, ඉන් රු.2,003,449 ක් අවුරුදු 01 කට වැඩි කාලසීමාවක සිට අයවීමට තිබුණි. එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii). වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අනුයුක්තව සේවය කළ ග්‍රාම නිලධාරීවරයෙකු 2013 ජූනි 12 දින සේවය හැර ගොස් තිබූ අතර, එදිනට ඔහුගෙන් අයවිය යුතු හිඟ දේපළ ණය ශේෂය රු.150,775 ක් විය. ඒ සඳහා ඇපයට තබන ලද දේපළ ව්‍යාජ ඔප්පුවක් සකස් කර වෙනත් අයෙකුට විකුණා ඇති බවද වාර්තා වී තිබුණි.

**(ඉ) පොදු තැන්පත් ගිණුම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට අංක 6003/000/00/0048/0000/000 දරන තැන්පත් ගිණුමේ ශේෂ එකතුව රු.460,847,238 ක් විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). වර්ෂ 02 ක් ඉක්ම වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 කට අදාල එකතුව රු.3,885,652 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ii). වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා ආයතන විසින් විවිධ කාර්යයන් සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 09 කට ලබා දී තිබුණු එකතුව රු.3,927,004 ක මුදල් අදාල කාර්යභාරයන් ඉටු නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(iii). ඉඩම් වන්දි ගෙවීම් සඳහා විවිධ ආයතනවලින් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 07 කට ලබා දී තිබූ එකතුව රු.5,304,301 ක් වූ මුදල් අදාල පාර්ශවයන් හඳුනාගෙන නිරවුල් නොකර තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

(iv). 2010 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා අවස්ථා 03 කදී ලැබී තිබුණු එකතුව රු.100,000 ක ආබාධිත නිවාස ආධාර 2013 දෙසැම්බර් 31 දින වන විටත් පොදු තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි.

## 1.6 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

---------------------------------------

### 1.6.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

------------------------------

2010 මාර්තු 10 දිනැති අංක.පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ 1.4.1 ඡේදය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම 2013 මාර්තු මාසයේදී පිළියෙල කර තිබුණි.

### 1.6.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2013 වර්ෂයට අදාල වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර තිබුණි.

### 1.6.3 අභ්‍යන්තර විගණනය

--------------------------

ජ්‍යෙෂ්ඨ ගණකාධිකාරීවරයෙකු ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරී ලෙස පත්කර අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා තිබූ අතර, එමගින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ගනුදෙනු පරීක්ෂා කර වාර්තා නිකුත් කර තිබුණද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගනුදෙනු පරීක්ෂා කිරීම එමගින් සිදුකර නොතිබුණි. ඒ සඳහා ජ්‍යෙෂ්ඨත්වය හා පළපුරුද්ද සහිත නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් යොදවනු වෙනුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අනුයුක්ත කරන ලද උපාධිධාරී නිලධාරීන් වැඩි සංඛ්‍යාවක් යොදවාගෙන තිබුණි.

### 1.6.4 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

--------------------------------------------------------

2013 වර්ෂයේදී විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 03 ක් පමණක් පවත්වා තිබුණි.

## 1.7 වත්කම් කළමනාකරණය

----------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ) නිෂ්ක්‍රිය හා ඌන උපයෝජිත වත්කම්**

**---------------------------------------------**

පහත වර්ග කර ඇති පරිදි සමහර වත්කම් නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවැතුණි.

| **වත්කම් වර්ගය** | **ප්‍රාදේශීය ලේකම් කාර්යාලය** | **ඒකක ගණන** | **නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති කාලය** |
| --- | --- | --- | --- |
| (i). ඉඩම් (හෙක්ටයාර) | අලව්ව | 01 (ඒකක ගණන නොදැක්වේ. ප්‍රා.ලේ. නිල නිවස පිහිටි ඉඩම) | වර්ෂ 13 පමණ |
| (ii). ගොඩනැගිලි | අලව්ව | 01 (ප්‍රා.ලේ. නිල නිවස) | වර්ෂ 13 පමණ |
| (iii). මෝටර් වාහන | කොබෙයිගනේ රස්නායකපුර | කැබ් රථ - 01<br>යතුරු පැදිය- 01 (හීරෝ හොන්ඩා) | වර්ෂ 01 පමණ<br>නොදැක්වේ. |
| | කොටවෙහෙර | අත්ට්‍රැක්ටර - 01<br>ට්‍රේලර - 01 (ලියාපදිංචි අංකය නොදැක්වේ.)<br>යතුරු පැදි - 01 | 1993 සිට<br>1993 සිට<br>1993 සිට |
| (iv). යන්ත්‍රසූත්‍ර | රස්නායකපුර | උස මනින උපකරණ - ළමා 01<br>දුරකථන - 01<br>බයිසිකල් - 01<br>වතුර ෆිල්ටර් - 01<br>බිත්ති ඔරලෝසු - 03 | 2007 පෙර සිට<br>2007 පෙර සිට<br>2007 පෙර සිට<br>2007 පෙර සිට<br>2007 පෙර සිට |
| | කොටවෙහෙර | ගණක යන්ත්‍ර - 08<br>ඡායා පිටපත් යන්ත්‍ර - 01<br>වීදුරු කපන යන්ත්‍ර - 01<br>කිනිහිර - 01<br>ගිනිගල් - 01 | 2007 පෙර සිට<br>2007 පෙර සිට<br>1993 සිට<br>1993 සිට<br>1993 සිට |
| (v). වෙනත් වත්කම් | රස්නායකපුර<br>අඹන්පොල | හම් බෑග් - 08<br>ලීටර 500 ජල ටැංකි - 13<br>ලීටර 1000 ජල ටැංකි - 12 | 2007 පෙර සිට<br>නොදැක්වේ. |

(vi). මාස්පොත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ඇඟිලි සලකුණු යන්ත්‍රය පරිගණක ජාලයට සම්බන්ධ කර තිබුණද, තාක්ෂණික හේතූන් මත එහි වාර්තා ලබාගත නොහැකිවීමෙන් එය ඌන උපයෝජිතව තිබුණි.

(vii). 2012 වර්ෂයේ විමධ්‍යගත අයවැය යටතේ බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ස්වේච්ඡා සංවිධානවලට ලබාදීමට මිලදීගෙන තිබූ රු.40,940 ක් වටිනා උපකරණ විෂයයන් 07 ක් වර්ෂයකට වැඩි කාලයක් ගබඩාවේ රඳවාගෙන තිබීමෙන් ඌන උපයෝජිතව තිබුණි.

**(ආ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). 2012 හා ඊට පෙර වර්ෂවල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් විනාශ කිරීමට නිර්දේශිත අබිලි භාණ්ඩ විශාල ප්‍රමාණයක් කාර්යාල පරිශ්‍රය තුළ ස්ථාන කීපයක ගොඩ ගසා තිබුණි. වර්ෂ ගණනාවක සිට ප්‍රයෝජනයට ගත නොහැකි ඉන්වෙන්ට්‍රි භාණ්ඩ තොගයක්ද අලව්ව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගබඩාවේ රඳවාගෙන තිබුණි.

(ii). කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීනව පවත්වා නොතිබුණ අතර, ආයතනයට අයිතිය නොමැති වාහනයක් වත්කම් ලේඛනයේ දක්වා තිබුණි. එහෙත් ඉඩම්, ගොඩනැගිලි හා වාහන 02 ක් ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණි.

(iii). සමාජ සේවා හා සමාජ සුභසාධන අමාත්‍යාංශයෙන් කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2008 වර්ෂයේදී ලබා දී තිබූ සිංගර් වර්ගයේ මහන මැෂින් 05 ක් හා ඕවර්ලොක් මැෂිමක් ස්ථාවර වත්කම් ලේඛනයට ගෙන නොතිබුණි. ඒ බව විගණනයෙන් පෙන්වා දුන් පසුව ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කළ බව දන්වා තිබුණද, 2013 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණයට එම වත්කම් ඉදිරිපත් කර නොතිබුණි.

(iv). මාස්පොත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය 2013 වර්ෂය අවසානයටද ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි.

(v). ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2012 සමීක්ෂණ මණ්ඩල වාර්තා මඟින් අළුත්වැඩියා කර ප්‍රයෝජනයට ගත යුතු බවට නිර්දේශ කර තිබූ ජෙනරේටරය යථා තත්ත්වයට පත් නොකිරීම නිසා 2013 වර්ෂයේදීද ප්‍රයෝජනයට ගත නොහැකිව තිබුණි.

(vi). 2009 සමීක්ෂණ මණ්ඩල වාර්තාවේ නිර්දේශ අනුව, විකුණා තිබූ ඡායා පිටපත් යන්ත්‍රයක් 2013 වර්ෂය අවසානයටද ගැණුම්කරු විසින් රැගෙන නොයාම නිසා ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගබඩාවේ තිබුණි.

**(ඇ) පවරා නොගත් වත්කම් අවිධිමත් ලෙස පරිහරණය කිරීම**

**---------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). මාස්පොත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය පිහිටි ඉඩම වයඹ අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් විධිමත් පරිදි පවරා නොගෙන භාණ්ඩාගාර ප්‍රතිපාදන උපයෝගී කරගෙන එහි 2007 වර්ෂයේ සිට ගොඩනැගිලි ඉදිකර තිබුණි.

(ii). අයිතිය රජයට නොපැවරුනු පර්චස් 10 ක පෞද්ගලික ඉඩමක රු.1,625,002 ක් වැයකර බිංගිරිය බහුකාර්ය සංවර්ධන ගොඩනැගිල්ල ඉදිකර තිබුණි.

**(ඈ) බේරුම් නොකළ බැරකම්**

**-----------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම්වල එකතුව රු.20,958,186 ක් වූ අතර, ඉන් රු.15,384,370 ක් වර්ෂ 01 ට වැඩි වර්ෂ 03 කට අඩු කාලයක සිටද, රු.5,573,816 ක් වර්ෂයකට අඩු කාලයක සිට පැවැත එමින් තිබුණි.

**1.8 අනුකූල නොවීම්**

**------------------**

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**-----------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| **නීති, රීති හා රෙගුලාසි යනාදියට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** |
|---|---|---|
| | **රු.** | |
| (අ). **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| XIX වැනි පරිච්ඡේදයේ 5 හා 6 වගන්ති | - | (i) කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු නිල හා පොදු නිවාසවල පදිංචිකරුවන් 16 |

දෙනෙකුගේ (ස්වාමි පුරුෂයා/භාර්යාව) වාර්ෂික වැටුප් වර්ධක හා වැටුප් සංශෝධන මඟින් වැඩිවූ අගයන්ද සැලකිල්ලට ගෙන නිවාස කුලී අය කිරීමට පියවර ගෙන නොතිබුණි. ඔවුන්ගෙන් නිල හා පොදු නිවාස භාර ගැනීමේ දිනයේ පැවැති වැටුප පදනම් කර ගෙන ස්ථාවර කුලියක් අයකර තිබුණි.

(ii) වැව රවුමේ රජයේ පොදු සේවා නිවාසයක 2012 ජූනි 18 දින සිට නීත්‍යානුකූලව පදිංචියට භාර දී තිබූ නිලධාරියා වෙනුවට අනවසර වෙනත් රජයේ නිලධාරියෙකු පදිංචිව සිටින බව ස්ථානීය විගණන පරීක්ෂණයේදී අනාවරණය විය.

(ආ). **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

(i) මුදල් රෙගුලාසි 1645 - කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු වාහන දෙකක දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 1645 (අ) - මාස්පොත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් වාහන දෙකක ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(ඇ). **රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

1990 ඔක්තෝබර් 10 දිනැති අංක.41/90 දරන චක්‍රලේඛය - දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 හි වාහනවල ඉන්ධන පාරිභෝජනය පරීක්ෂා කර නොතිබුණි.

(ඇ ) **ජාතික අයවැය චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන චක්‍රලේඛයේ 1:1:6 වගන්තිය | 252,712 | පඩුවස්නුවර (නැගෙනහිර) හා නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් ස්ථාන මාරුවීම් ලැබ ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු ණය ශේෂ මාස දෙකක් තුළ නිරවුල් කර නොතිබුණි. |

(ඉ). **වෙනත් චක්‍රලේඛ**

| | | |
|---|---|---|
| 2012 ඔක්තෝබර් 23 දිනැති අංක.A2/වැට/චක්‍ර/2012/04 දරන වන සංරක්ෂණ ජනරාල්ගේ ලිපිය | 7,948 | වාරියපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආදායම් ශීර්ෂය යටතේ එකතු කරන ලද මුදල් ඊළඟ මාසයේ පළමු සතිය තුළ ප්‍රේෂණය කර නොතිබුණ අතර, බලපත්‍ර ගාස්තු ලේඛනයද යාවත්කාලීනව පවත්වා නොතිබුණි. |

## 1.9 වයාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

(අ) **ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 06 ක් විසින් පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර නොතිබුණි.

| ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ යුතු වූ දිනය | ආරම්භ නොකිරීමට හේතු කෙටියෙන් |
|---|---|---|---|
| | රු. | | |
| ප්‍රාදේශිය ලේකම් කාර්යාල 6 ක විමධ්‍යගත, ගම නැඟුම, වයඹ පුබුදුව, දැයට කිරුළ ව්‍යාපෘතිවල මාර්ග ගොඩනැගිලි, පානීය ජල ව්‍යාපෘති ඇතුළු ව්‍යාපෘති 49 ක් | 13,757,740 | 2013.02.02 සිට 2013.12.28 දක්වා දිනයන් | භාරගත් කොන්ත්‍රාත්කරුවන් කාර්යයන් ඉටු නොකිරීම, ප්‍රමාණවත් ප්‍රතිපාදන නොතිබීම, ප්‍රතිපාදන ප්‍රමාද වී සැළසීම, අයහපත් කාලගුණය, ඉඩම් ගැටලු මතුවීම, මහ නැඟුම යටතේ ප්‍රතිපාදන සළසා තිබීම, දැයට කිරුළ සංවර්ධන කටයුතු නිසා ඉටු කිරීමට නොහැකිවීම |

## (ආ) ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 05 ක පහත සඳහන් ව්‍යාපෘති ආරම්භ කර තිබුණත්, එම ව්‍යාපෘති නිම නොකර අත්හැර දමා තිබුණි.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | 2013 දෙසැම්බර් 31 දින වන විට වියදම | අත්හැර දැමීමට හේතු |
|---|---|---|---|---|---|
| | | රු. | | රු. | |
| මාස්පොත | සාරගම ජනාධිපති බාලිකා විදුහලේ පානීය ළිඳ ඉදි කිරීම (ප්‍රාථමික පාසැල් 5,000 වැඩසටහන) | 693,825 | 2013.05.14 | 227,098 | කපන ලද ළිඳ කඩා වැටීම |
| පොල්ගහවෙල | ජල ව්‍යාපෘති 03 | 3,633,551 | 2012.08.20 දින සිට 2012.11.28 දින දක්වා | දක්වා නැත | ගිවිසුම්ගත සංවිධාන කොන්ත්‍රාත් ඉටු කිරීම පැහැර හැරීම |
| පන්නල | විමධ්‍යගත ව්‍යාපෘති 01 | 14,549 | 2013.10.31 | දක්වා නැත | නියමිත ස්ථානයේ ඉදි නොකිරීම |
| | වයඹ පුබුදුව ව්‍යාපෘති 05 | 555,229 | 2013.09.11 දින සිට 2013.12.19 දින දක්වා | දක්වා නැත | කාලය ප්‍රමාණවත් නොවීම නිසා වැඩ නිම කිරීමට නොහැකි වීම |
| කුලියාපිටිය (බටහිර) | වයඹ පුබුදුව - සුළු වාරිමාර්ග ව්‍යාපෘති 01 | 197,764 | 2013.11.06 | දක්වා නැත | කුඹුරු වැඩ අවසන් වන තෙක් ක්‍රියාත්මක නොකිරීම |
| මහව | මාර්ග ව්‍යාපෘති 04 | 245,857 | 2013.09.16 හා 2013.10.03 | දක්වා නැත | ප්‍රාදේශීය සභාව ගිවිසුම්ගතවීම පමණක් සිදුකර ඇතත්, ගම්වාසීන්ගේ විරෝධය |

## (ඇ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක පහත සඳහන් ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

| ප්‍රාදේශීය ලේකම් කාර්යාලය | ව්‍යාපෘතිය | ඇස්තමේන්තුගත පිරිවැය | ආරම්භ කළ දිනය | නිම කළ යුතු දිනය | නිම කළ දිනය | 2013 දෙසැම්බර් 31 දින වන විට වියදම | ප්‍රමාදයට හේතු |
|---|---|---|---|---|---|---|---|
| | | රු. | | | | රු. | |
| රිදීගම | ජල ව්‍යාපෘති - 01<br>සුළු වාරිමාර්ග - 03 | 7,136,720 | 2013.10.11<br>2013.12.18, 19,26 | 2013.12.31 | -<br>- | 88,480<br>- | ප්‍රතිපාදන ප්‍රමාද වීම නිසා කාලය ප්‍රමාණවත් නොවීම |
| ඉබ්බාගමුව | දැයට කිරුළ - සුළු වාරිමාර්ග - 02 | 2,308,760 | 2013.12.24<br>2013.12.30 | 2013.12.31<br>දක්වා නැත. | -<br>- | 216,627<br>- | කාලය ප්‍රමාණවත් නොවීම |
| පන්නල | වයඹ පුබුදුව සුළු වාරිමාර්ග- 03 | 396,000 | 2013.08.30<br>2013.10.23, 24 | 2013.11.30<br>2013.12.08 | - | 356,400 | වර්ෂාව හා අමුද්‍රව්‍ය සපයා ගැනීමේ අපහසුව |
| පඩුවස්නුවර (නැගෙනහිර) | නාන මංකඩ - 02<br>වැව් ප්‍රතිසංසකරණ - 17<br>සුළු වාරිමාර්ග - 01<br>බෝක්කු -01<br>ඇලවේලි -01 | 12,548,829 | 2013.12.04 සිට 2013.12.26 දක්වා | 2013.12.31 | - | 1,099,971 (ව්‍යාපෘති 05 කට) | කාලය ප්‍රමාණවත් නොවීම, වැව්වල ජලය පිරී තිබීම |

**(ඇ) මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). වයඹ පුබුදුව යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 14 ක විදුලිය සැපයුම් දීර්ඝ කිරීමේ ව්‍යාපෘති 36 ක් සඳහා රු.9,952,600 ක් නිදහස් කර තිබුණද, ඒවාට මුදල් නොගෙවීම නිසා වර්ෂය තුළ ක්‍රියාත්මක කර නොතිබුණි.

(ii). විමධ්‍යගත අයවැය යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 08 ක විදුලි ව්‍යාපෘති 14 ක් සඳහා රු.2,092,036 ක් වර්ෂය අවසානයේ විදුලි බල මණ්ඩලයට ගෙවීම් කර තිබුණද, එම ව්‍යාපෘති ඉටුකර නොතිබුණි.

(iii). 2013 වයඹ පුබුදුව යටතේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 07 ක ව්‍යාපෘති 36 ක් ක්‍රියාත්මක කිරීමට රු.4,490,000 ක ප්‍රතිපාදන සළසා තිබුණද, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කර නොතිබුණි.

(iv). කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ 2012 විමධ්‍යගත අයවැය යටතේ විදුලි ව්‍යාපෘති 05 ක් ක්‍රියාත්මක කිරීමට රු.420,000 ක් ලංකා විදුලි බල මණ්ඩලයට ගෙවා තිබුණද, ඉන් රු.40,000 ක් වූ එක් ව්‍යාපෘතියක ඉදිකිරීම් 2014 වර්ෂයේදී ආරම්භ කර තිබුණි. රු.55,000 ක් වූ ව්‍යාපෘතියක් වෙනත් විදුලි දිගුවක් මඟින් ආවරණය වීම නිසා විකල්ප වෙනත් ව්‍යාපෘතියක් නම් කිරීම හෝ එම මුදල ආපසු ලබා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

**1.10 කාර්යසාධනය**

-------------------

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

**---------------------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල සිය අරමුණුවලට අදාල කාර්යවලින් බැහැරව ක්‍රියාකළ අවස්ථා නිරීක්ෂණය වූ අතර, නියැදි පරීක්ෂණවලදී එසේ අනාවරණය වූ අවස්ථා කීපයක් පහත දැක්වේ.

(i). 2012 දිවි නැඟුම වැඩසටහන යටතේ රු.11,475,164 ක් වැයකර කිකිළි පැටවුන් 54,870 ක් පවුල් 5,487 අතර බෙදා දී තිබුණි. පහත දැක්වෙන කරුණු අනුව මෙම වැඩසටහන මූලික පරමාර්ථවලින් බැහැරව ඉටුකර ඇති බව නිරීක්ෂණය විය.

★ 2012 ජූලි 10 දිනැති අංක.2/2012 දරන දිවි නැඟුම චක්‍රලේඛයේ උපදෙස්වලට පටහැනිව ගම් කිකිළි පැටවුන් වෙනුවට ෆාම් කිකිළි පැටවුන් ලබා දීම.

★ ලබා දුන් ෆාම් කිකිළි පැටවුන් නඩත්තු කිරීමට අධික පිරිවැයක් දැරීමට සිදු වී තිබීම හා පාරිසරික තත්ත්වයන්ට අනුවර්තනය නොවන නිසා කූඩු තුළ විශේෂිත තත්ත්වයන් යටතේ රැකබලා ගැනීමට සිදු වීම.

★ අඛණ්ඩ කුකුළු පාලනය සඳහා අවශ්‍ය පැටවුන් එම බිත්තරවලින් අභිජනනය කරගත නොහැකි වීම.

- ★ එක් ප්‍රතිලාභියෙකුට කිකිළි පැටවුන් නඩත්තු කිරීමේදී දළ වශයෙන් රු.13,517 ක පාඩුවක් දැරීමට සිදු වීම.

- ★ ලිංග භේදය වර්ග කිරීමකින් තොරව කිකිළි පැටවු ලබා දීම නිසා පිරිමි සතුන්ද බෙදා දී තිබීම.

- ★ ප්‍රතිලාභීන්ට ෆාම් කිකිළි පැටවුන් ඇති කිරීම සම්බන්ධයෙන් විධිමත් පුහුණුවක් ලබා නොදීම.
- ★ කිකිළි පැටවු විශාල සංඛ්‍යාවක් විලෝපිකයින්ට/රෝගාබාධවලට ලක්වීමෙන් මියයාම.

- ★ විධිමත් පසුවිපරම් ක්‍රියාවලියක් ක්‍රියාත්මක නොකිරීම නිසා නිවැරදි දත්තයන් වාර්තා වී නොතිබීම.

- ★ දිවි නැගුම චක්‍රලේඛයේ උපදෙස්වලට පටහැනිව මහ පරිමාණ කුකුළු ගොවිපලවල් පවත්වාගෙන යනු ලබන තැනැත්තන්ටද, (නාරම්මල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය) හා එකම පවුලේ භාර්යාවට හා ස්වාමි පුරුෂයාටද කිකිළි පැටවුන් ලබා දී තිබීම. (මහව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය)

(ii). කොබෙයිගනේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සුළු පරිමාණ කිරි ගොවීන් දිරිමත් කිරීම සඳහා ප්‍රතිලාභීන් 18 දෙනෙකු අතර ගව ගාල් ඉදිකර ගැනීමට රු.617,400 ලබා දී තිබුණි. ඉන් එකතුව රු.102,900 ක ආධාර ලැබූ ප්‍රතිලාභීන් තිදෙනෙකු විධිමත් ලෙස ගව ගාල් ඉදිකර නොතිබුණු අතර ප්‍රතිලාභීන් ගව පාලනය සිදු නොකරන බවත් ස්ථානීය පරීක්ෂණයේදී අනාවරණය විය.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වූ පහත දැක්වෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටුකර නොතිබුණ අතර, එසේ නිරීක්ෂණය වූ අවස්ථා කීපයක් පහත දැක්වේ.

(i) 2011 ගම නැගුම ව්‍යාපෘතිය මඟින් අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තෝරාගත් පවුල් 80 ක් අතර රු.251,700 ක වියදමින් කිකිළි පැටවුන් 800 ක් බෙදා දී තිබුණද, අඩු ආදායම් ලාභීන්ගේ ජීවන තත්ත්වය, පෝෂණය නැන්වීම හා ස්වයං රැකියාවකට යොමු කරවීම වැනි අරමුණු ඉටුවන පරිදි කිකිළි පැටවුන් මිලදී ගැනීම හා ප්‍රතිලාභීන් තෝරා නොගැනිම නිසා ව්‍යාපෘතිය අසාර්ථක වී තිබුණි.

(ii) අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ස්වේච්ඡා සංවිධාන 12 කට රු.391,044 ක් වටිනා භාණ්ඩ හා උපකරණ 2013 වර්ෂයේදී ලබා දී තිබුණද, ඒ පිළිබඳ විස්තර ලේඛන ගත කර නොතිබුණි.

(iii) ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ 2012 වර්ෂයේ දිවි නැඟුම වැඩසටහන යටතේ රු.42,800 ක් වටිනා මී හා මහෝගනී දැවමය පැල 8,300 ක් අතුරින් පැල 4,786 ක්ද, හා රු.70,500 ක් වූ පළතුරු වර්ග 06 ක පැල 1,650 කින් පැල 626 ක්ද විනාශ වී තිබුණි.

(iv) 2012 විමධ්‍යගත අයවැය මඟින් අවස්ථා 12 කදී රු.305,210 ක් වැයකර භාණ්ඩ හා උපකරණ ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් මිලදීගෙන ස්වේච්ඡා සංවිධාන අතර බෙදා දී තිබුණද, ඒවායේ පිරිවිතර සම්බන්ධයෙන් සැලකිල්ලක් දක්වා නොතිබුණි.

(v) ප්‍රාථමික පාසල් 5,000 ක් වැඩිදියුණු කිරීමේ ජාතික වැඩසටහන යටතේ බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තල්ගස්පිටිය කණිෂ්ඨ විද්‍යාලයේ ප්‍රධාන ශාලාවේ වහලයට සවි කළ වඩිම්බු ලැලිවලට දෙවරක් තීන්ත ආලේප කර නොතිබූ අතර, යොදා තිබූ වඩිම්බු ලැලි ස්ථාන 03 කින් පුපුරා තිබුණි. තවද, වහලයේ දිරාපත් වූ අගු කොටස් අළුත්වැඩියා කර බිඳීගිය උළුකැට වෙනුවට අළුතින් උළු සෙවිලි කිරීම සිදුකර නොතිබුණි. බෝවත්ත කණිෂ්ඨ විද්‍යාලයේ වැඩිදියුණු කිරීම්වල ප්‍රධාන ශාලාවේ වටපිල ස්ථාන 05 කින් පුපුරා ගොස් තිබුණ අතර, එහි සමහර ස්ථාන බොල් වී තිබුණි.

(vi) 2012 දිවි නැඟුම වැඩසටහන යටතේ බිංගිරිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ බෙදාදීම සඳහා අප්‍රිකානු මහෝගනී (කායා) පැල 15,600 ක් රු.97,600 ක ප්‍රවාහන හා කම්කරු කුලී දරා ලබාගෙන තිබුණි. එම පැලවලින් සියයට 88 ක් හෙවත් පැල 13,734 ක් බෙදා හැරීමට පෙර හා බෙදා දුන් පසු විනාශ වී තිබීමෙන් රු.85,926 ක පාඩුවක් සිදුව තිබුණි. තවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයෙන් රු.26,840 ක් වැය කර මිටි මුරුංගා පැල 2,000 ක් බිංගිරිය ප්‍රාදේශීය ලේකම් හරහා බෙදාදීමට ලබා දී තිබුණි. එම පැල ප්‍රතිලාභීන්ට ලබාදීමට පෙර විනාශ වී තිබීමෙන් කර තිබුණු වියදමද නිෂ්ඵල වී තිබුණි.

(vii) වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාථමික පාසැල් 5,000 ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ වේපත්අංග කණිෂ්ඨ විද්‍යාලයේ පැරණි ගොඩනැගිල්ල සංවර්ධනයේදී ගොඩනැගිල්ලේ වහලයේ මුදුන නිසි පරිදි ආවරණය නොකිරීමෙන් වහලය දිරාපත් වීම, වැසි දිනවල පන්ති කාමරවලට ජලය ගලා ඒම සහ ගෙබිම ප්‍රමිතියට කොන්ක්‍රීට් අතුරා නොතිබීම වැනි අඩුපාඩු නිරීක්ෂණය විය.

(viii) වාරියපොළ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ එකී ව්‍යාපෘතිය යටතේ මිරිහානේගම කණිෂ්ඨ විද්‍යාලයේ ගොඩනැගිල්ල අළුත්වැඩියා කිරීමට මි.මි.220x20 ප්‍රමාණයේ වඩිම්බු ලැලි දික් අඩි 250 ක් ඇස්තමේන්තු කර ඒ

සඳහා ගෙවීම් කර තිබුණද, ඒ සඳහා ගලවා ඉවත් කරන ලද ලෑලිද උපයෝගී කරගෙන තිබූ අතර, සවිකර තිබූ වඩිම්බු ලෑලි පුපුරා යාමද සිදුව තිබුණි.

(ix) 2011/2012 වර්ෂයේ දිවි නැඟුම වැඩසටහන යටතේ වාරියපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ආරක්ෂිත පැල ගෘහ 37 ලබාදීමට රු.3,041,999 වැයකර තිබුණද, ඒවා පවත්වාගෙන යාමට ප්‍රතිලාභීන්ට විධිමත් පුහුණුවක් ලබා නොදීමෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(x) 2012 වර්ෂයේ දිවි නැඟුම සමෘද්ධි සංවර්ධන වැඩසටහන යටතේ මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ හරිතාගාර තුළ බෝග වගාව, බිම්මල් වගාව, මීමැසි පාලනය, එළු පාලනය, ගව ගාල් ඉදි කිරීම, විසිතුරු මල් වගාව සහ විසිතුරු මසුන් ඇති කිරීම සඳහා රු.1,473,000 ක් ප්‍රතිපාදනය කර තිබුණද, විසිතුරු මසුන් ඇති කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර නොතිබුණි. ඉතිරි ව්‍යාපෘති 06 සඳහා රු.1,335,400 ක් වැයකර තිබුණද, පසුවිපරම් නිසි පරිදි සිදු නොකිරීම නිසා ප්‍රතිලාභීන් මන්දෝත්සාහී වීමෙන් අපේක්ෂිත අරමුණුවලට ළඟාවීමට අපොහොසත් වී තිබුණි.

(xi) 2013 යල කන්නයේ අතිරේක බෝග වගා වැඩසටහන යටතේ මුං, මිරිස්, සෝයා හා රටකජු බීජ කි.ග්‍රෑ.1,504 ක් මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තෝරාගත් ගොවීන් අතර බෙදා දී තිබුණද, එයින් මිරිස් හැර ඉතිරි බෝග වර්ග 03 හි කි.ග්‍රෑ.228 සිටුවා නොතිබුණි. වර්ග හෙක්ටයාර 34.34 ක ඉතිරි බෝග වගා කර තිබුණද, අයහපත් කාලගුණ තත්ත්වය මත හෙක්ටයාර 18.18 ක වගාව හානි වී තිබුණි.

## 1.11 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු

--------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) අක්‍රීය බැංකු ගිණුම්

---------------------

ඉබ්බාගමුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් පවත්වාගෙන යනු ලැබූ ජංගම ගිණුම් දෙකක පිළිවෙලින් රු.20,322 ක හා රු.2,891 ක ශේෂයයන් 2013 දෙසැම්බර් 31 දින වන විට වර්ෂ 15 ක හා වර්ෂ 12 ක කාලයක් මුළුල්ලේ අක්‍රීයව පැවැතුණි.

### (ආ) ගැලපුම් කළ යුතු ශේෂ

---------------------------

කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක් විසින් 2013 දෙසැම්බර් මාසය සඳහා පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශවල දැක්වුණු ගැලපුම් පිළිබඳ විග්‍රහයට අනුව මාස 06 සිට වර්ෂ 01 දක්වා කාලයක සිට පැවති එන

නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත්වල වටිනාකම රු.5,321 ක් තිබුණි. මේ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඇ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**1.12 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

----------------------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ඒ යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(i). 2012 වර්ෂයේ ගම නැගුම - "එක් ගමකට එක් වැඩක්" යටතේ මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ කුරුණෑගල ප්‍රාදේශීය සභාව සතු පාරවල් 19 ක් කොන්ක්‍රීට් කිරීමට රජයේ දායකත්වය ලෙස රු.18,456,659 ක් ගෙවා තිබුණද, රු.79,458 ක් වූ ප්‍රජා දායකත්වයෙන් ඉටු කළ යුතු දෙපස පස් පිරවීම සිදු කිරීමකින් තොරව ඒවායේ වැඩ නිමකර තිබුණි.

(ii). දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂයට අදාලව අවස්ථා 03 කදී එකතුව රු.74,265 ක් වටිනා මූලධන වියදම් පුනරාවර්තන වියදම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

**1.13 අවිධිමත් ගනුදෙනු**

----------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i). 2013 වර්ෂය සඳහා බදු කුලී හා විදුලිය වෙනුවෙන් එකතුව රු.138,123 අයවීමට හිඟව තිබූ බදුකරුවකු වෙතම විධිමත් ගිවිසුමකින් තොරව 2014 මුල් මාස 04 සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලීය ආපන ශාලාව පවත්වාගෙන යාමට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි. පසුව මුළු වර්ෂය සඳහාම එම බදුකරු වෙතම කොන්ත්‍රාත්තුව පැවරීම සිදුකර තිබුණි.

(ii). දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු නිල / පොදු සේවා නිවාස 33 ක් සම්බන්ධයෙන් වූ බදු කුලී ලේඛන ක්‍රමානුකූලව යාවත්කාලීනව පවත්වා නොතිබුණි.

(iii). වාරියපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් විශ්‍රාමිකයින් 15 දෙනෙකුගෙන් ජීවත්ව සිටින බවට සහතිකය ලබා නොගෙන විශ්‍රාම වැටුප් ගෙවා තිබූ අතර, මිය ගිය විශ්‍රාමිකයින් 23 දෙනෙකුගේ මරණය සිදු වූ දිනයන් සහතික කර ගැනීම සඳහා ග්‍රාම නිලධාරීන් වෙතින් අවශ්‍ය සහතිකයද ලබාගෙන නොතිබුණි. තවද, වාරියපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් 2013 වර්ෂයේ විශ්‍රාම වැටුප් පිළියෙල කරනු ලබන

විශ්‍රාමිකයින් සම්බන්ධයෙන් විධිමත් පරිදි ග්‍රාම නිලධාරීන් වෙතින් වාර්තා ලබා නොගැනීම නිසා මිය ගිය විශ්‍රාමිකයින් 06 දෙනෙකු සඳහා විශ්‍රාම වැටුප් පිළියෙල කර මාස 02 සිට මාස 09 දක්වා කාල පරාසයක් තුළ රු.464,333 ක් ඔවුන්ගේ බැංකු ගිණුම්වලට යවා තිබුණි. එසේම පූර්ණ අකර්මණ්‍යතාවය මත විශ්‍රාම වැටුප් ලබා ගැනීමට නොපැමිණි විශ්‍රාමිකයින්ට ගෙවීම් කිරීමට අදාල තොරතුරු ග්‍රාම නිලධාරීන් වෙතින් ලබාගෙන නොතිබුණි.

## 1.14 වංචනික ස්වරූපයේ ගනුදෙනු

2013 ජනවාරි සිට නොවැම්බර් දක්වා මාස්පොත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ වාහනයක දෛනික ධාවන සටහන් රියදුරු විසින් වංචනික ලෙස වෙනස් කර තිබූ අතර, එම කාලසීමාවේදී වාහනයේ මයිලෝමීටරය ක්‍රියාකාරී තත්ත්වයේ තිබූ බව ප්‍රදේශීය ලේකම් වාර්තා කර තිබුණි. 2013 පෙබරවාරි 27 දින ඉන්ධන ශේෂය සාවද්‍ය ලෙස දෛනික ධාවන සටහන්වල දක්වා ඉන්ධන ලීටර 37.1 ක් වංචා කිරීමට කටයුතු කර තිබුණි. එසේම 2013 මාර්තු සිට මැයි අවසානය දක්වා දින 07 කදී ලබාගත් ඉන්ධන ලීටර 162.3 ක් ධාවන සටහන්වලට ඇතුළත් කර තිබුණත්, ඒවායේ ඇණවුම් අංක දක්වා නොතිබුණි.

## 1.15 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී ගනේවත්ත, වීරඹුගෙදර හා මාවතගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර තිබූ වාහන 03 කට සිදුව තිබූ රු.2,166,360 ක අලාභ හානි වෙනුවෙන් රක්ෂණයෙන් හා වගකිවයුත්තන්ගෙන් රු.1,832,271 ක් අය වී තිබුණත්, එය විසර්ජන ගිණුමේ හෙළිදරව් කර නොතිබුණි.

(ආ) ගනේවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත වෙන්කරන ලද වාහනයට සමාලෝචිත වර්ෂයේදී සිදු වී තිබුණු රු.334,090 ක අලාභයක් වෙනුවෙන් රියදුරගෙන් මාසික වාරික ලෙස අයකර ගැනීමට තීරණය කර තිබුණි. 2013 වර්ෂයේ මාස 02 කට අදාලව රු.55,682 ක් අයකර ගෙන නොතිබුණ අතර, විධිමත් විනය පරීක්ෂණ කටයුතු අවසන් කර නොමැති නිසා අදාල අලාභය අයකර නොමැති බව දිස්ත්‍රික් ලේකම්වරයා වාර්තා කර තිබුණි.

## 1.16 අනාර්ථික ගනුදෙනු

-------------------------

නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ගණේවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අනුයුක්ත කර තිබුණු වාහන අළුත්වැඩියාවේදී ඉවත් කරනු ලබන අමතර කොටස් හා උපකරණ වෙනම ලේඛනයක ඇතුළත් කර නොතිබුණි.

(ආ) කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ඒ යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 කට අනුයුක්ත කර ඇති වාහනවල ඉන්ධන දහනය 1990 ඔක්තෝබර් 10 දිනැති අංක.41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපදෙස් අනුව, මාස 06 කට වරක් පරීක්ෂා කිරීමට කටයුතු කර නොතිබුණි.

## 1.17 කළමනාකරණ දුර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2013 වර්ෂයේ දිස්ත්‍රික්කයේ අනෙකුත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ තුළ ග්‍රාම නිලධාරී තනතුරු පුරප්පාඩු පිරවීමට අවශ්‍ය නිලධාරීන් නොමැති වීම නිසා රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්ගේ 2011 අගෝස්තු 12 දිනැති අංක.HAF/3/ADMIN/CMA/15 දරන ලිපියෙන් දී ඇති උපදෙස් අනුව, වැඩ බැලීම සඳහා වෙනත් වසම්වල ග්‍රාම නිලධාරීන් පත්කර තිබුණි. එහෙත් ඔවුන් ආයතන සංග්‍රහයේ VII පරිච්ජේදයේ 12 හා 13 වගන්තිවලට පටහැනිව බොහෝ කාලයක් එකම වසමේ වැඩ බැලීමට පත්කර තිබුණි.

(ආ) වාරියපොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2013 ජනවාරි සිට අගෝස්තු දක්වා අයකර ගෙන තිබූ රු.40,495 ක වැලි / පස් / බොරළු කැණීම්/ප්‍රවාහන යනාදි බලපත්‍ර ගාස්තු භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශයට යැවීමට නියමිත කාලය තුළ සිදුකර නොතිබුණි.

(ඇ) මාස්පොත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය මඟින් විශ්‍රාම වැටුප් පිළියෙල කර තිබුණු තැනැත්තන් 23 දෙනෙකුට රු.2,741,893 ක් වැඩිපුර ගෙවා තිබූ බව අනාවරණය වී තිබුණි. වැඩිපුර ගෙවන ලද මුදල් ආපසු අය කරනු ලබන බව වාර්තා කර තිබුණද, අය කරනු ලබන ක්‍රමවේදය හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සමාලෝචිත වර්ෂය අවසානයට ස්ථාන මාරු, මිය යාම්, විශ්‍රාම යෑම්, වැඩ තහනම් හා සේවය හැරගිය නිලධාරීන් 24 දෙනෙකුගෙන් රු.2,003,450 ක හිඟ ණය ශේෂයක් අයකර ගැනීමට විධිමත් ක්‍රියාමාර්ගයන් ගෙන නොතිබුණි.

**1.18 මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**---------------------------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට කුරුණෑගල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 30 ක් මඟින් සැපයූ තොරතුරුවලට අනුව, සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i). ජ්‍යෙෂ්ඨ මට්ටම | 116 | 110 | 07 | 01 |
| (ii). තෘතියික මට්ටම | 79 | 62 | 19 | 02 |
| (iii). ද්විතියික මට්ටම | 3,159 | 2,609 | 565 | 15 |
| (iv). ප්‍රාථමික මට්ටම | 345 | 284 | 61 | - |
| (v). වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 02 | 11 | - | 09 |
| **එකතුව** | **3,701** | **3,076** | **652** | **27** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 625 ක් පිරවීමට දිස්ත්‍රික් ලේකම් අපොහොසත් වී තිබුණි.

(ආ) කුලියාපිටිය (නැගෙනහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ එක් නිලධාරියෙකුද, කුලියාපිටිය (බටහිර) හා නිකවැරටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල තෘතියික මට්ටමේ නිලධාරීන් දෙදෙනෙකුද, ඉබ්බාගමුව හා කුලියාපිටිය (බටහිර) ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ද්විතියික මට්ටමේ නිලධාරීන් 15 දෙනෙකුද, ඉබ්බාගමුව, ගනේවත්ත, ගිරිබාව, කුලියාපිටිය (නැගෙනහිර), පොල්ගහවෙල, නිකවැරටිය, වීරඹුගෙදර හා බමුණාකොටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල වෙනත් සේවකයින් 09 දෙනෙකුද අනුමත කාර්ය මණ්ඩලයෙන් බැහැරව සේවයේ යොදවා තිබුණි.

(ඇ) මල්ලවපිටිය හා මහව ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ද්විතියික මට්ටමමේ නිලධාරීන් දෙදෙනෙකු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් දෙදෙනෙකුගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයේ සේවය සඳහා මුදාහැර තිබූ අතර, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ද්විතියක මට්ටමේ නිලධාරියෙකු අවුරුදු දෙකක කාල සීමාවකට වැටුප් රහිත විදේශ අධ්‍යාපන නිවාඩු ලබාගෙන තිබුණි.